# උඩරට රාජධානිය හා බැඳි නාථ දේව ඇදහිල්ලේ ඓතිහාසිකත්වය සම්බන්ධයෙන් විමර්ශනාත්මක අධ්‍යයනයක්

**රාජසිංහ කේ.එච්.ඩබ්ලිව්[1]**

උඩරට රාජධානිය, සෙංකඩගල රාජධානිය, මහනුවර රාජධානිය මේ කිනම් නාමයක් දැරූව ද මෙහි දී පැවසෙනුයේ ශ්‍රී ලංකාවේ අවසන් රාජධානිය සම්බන්ධයෙනි. මෙම රාජධානි යුගය හා එහි ව්‍යාප්තිය දැකගත හැකි ප්‍රදේශය තුළ එනම් මහනුවර නගරය කේන්ද්‍ර කර ගනිමින් ව්‍යාප්තිත භූමිය තුළ නාථ දේව ඇදහිල්ල අද දක්වා ම දැකගත හැක. දළඳා පෙරහැර සඳහා ද නාථ දේවාල පෙරහැර එක් වී තිබේ. නාථ දෙවියන් වශයෙන් මෙහි දී හඳුනා ගැනෙනුයේ අවලෝකිතේශ්වර ශ්‍රී නාථ හෙවත් මතු බුදු වීමට පෙරුම් පුරන්නා වූ යැයි සැලකෙන දේව චරිතයක් සම්බන්ධයෙනි. මෙම පර්යේෂණය සඳහා උඩරට ඉතිහාසය සමඟ නාථ දෙවියන්ගේ ඇති සබඳතාවය කෙබඳු ස්වභාවයක් ගන්නේ ද යන්න ගැටලුව වශයෙන් යොදාගෙන ඇති අතර මෙම ගැටලුව නිරාකරණය කර ගැනීම උදෙසා පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක ක්‍රමවේදය භාවිතයට ගැණින. එහි දී ප්‍රධාන වශයෙන් සාහිත්‍ය මූලාශ්‍රයන් අධ්‍යයනය සිදු කළ අතර ඒ සඳහා පුස්තකාල පරිශීලනය සිදු විය. ලිපි ලේඛන පරිශීලනයත් ජනප්‍රවාද වෙත අවධානය යොමු කර දත්ත රැස් කිරීමත් සිදු විය. එමතු ද නොව සාහිත්‍ය මූලාශ්‍රගත තොරතුරු තවදුරටත් සනාථ කර ගැනීම සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනයේ යෙදිණි. එහි දී මහනුවර ශ්‍රී නාථ දේවාලය හා මහනුවර නගරය නිරීක්ෂණයට යොමු විය. සම්මුඛ සාකච්ඡා ඔස්සේ ද දත්ත රැස් කෙරණි. මෙම ක්‍රමවේදයන් ඔස්සේ නාථ දේව ඇදහිල්ල මෙරටට ඉන්දීය ආභාසය ඔස්සේ මෙන් ම මහායාන ආභාසය හේතුවෙන් ලද බව දෘශ්‍යමාන විය. එහි ඉතිහාසය අනුරාධපුර යුගය තෙක් දිවයන බවත් පොළොන්නරුව, කුරුණෑගල ආදී යුගයන්හි දී ද යම් යම් දෑ එක් වී ඇති බවත් හඳුනාගත හැකි විය. මහනුවර නගරය ජනාවාස වීම සිදු වූයේ ද නාථ දේව ඇදහිල්ල හේතුවෙන් බව පැහැදිලි විය. මහායානික සංකේතයක් ලෙස දෘශ්‍යමානිත නාථ දෙවියන් ථේරවාදය හා සම්මිශ්‍රණය වී අද දක්වා නිරූපද්‍රිත ව ඇදහිල්ලක් වශයෙන් තවදුරටත් පවතින බව ඉතිහාසය හා වර්තමානය සලකා බැලීමේ දී පැහැදිලි විය. තව ද මහනුවර නගරයේ ආරම්භයත් නාථ දේව ඉතිහාසයත් එකිනෙකින් වෙන් කළ නොහැක්කක් බව නිගමනය කළ හැකි විය.

**මුඛ්‍ය පද :** උඩරට, ජනාවාස වීම, නාථ දෙවියන්, මහායාන, ථේරවාද

[1] පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පුරාවිද්‍යා අධ්‍යයනාංශය. hwathsala94@gmail.com